# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,579 — 1965 දෙසැම්බර් 7 වැනි අඟහරුවාද — 1965.12.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 449

අ. ආ. කා. අංකය : සී 162/49 (5)

කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, එස්. ජේ. වල්පිට මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ, සංවර්ධන අධ්‍යක්ෂ, ලංකා පරිපාලන සේවයේ සී. මයිල්වාගනම් මහතා තම රාජකාරිවලට අමතරව, 1965 දෙසැම්බර් 3 වැනි දින සිට කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත්කළ බව, මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 දෙසැම්බර 6 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී ය.

12–596

---

## මිල පාලන දැන්වීම්

අතිරේක ආහාර ද්‍රව්‍යය

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

අංකය : ජේ/දරණ ආහාර මිල නියෝගය

නියෝග

යාපනය දිසාවේ සහකාර මිල (ආහාර) පාලක තැනවූ ෂන්මුගම් පරමනාදන් වන මම, 1950 ගේ අංක 29 දරණ මිල පාලන පනතේ 3 (2) වන වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මට ලැබී ඇති බලතල අනුව, මෙම නියෝගයෙන්—

(1) 1962 ක්වූ නොවැම්බර් 19 වැනි දින හා අංක 13,397 දරණ රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද 1962 ක්වූ නොවැම්බර් 14 වැනි දින හා අංක ජේ/45/62 දරණ මගේ ආහාර මිල නියෝගය මෙවක් පටන් අවලංගු කරමි.

(2) මෙම දැන්වීම අග ඇති පළමුවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍ය යාපනය නගර සහා සීමාව ඇතුළු, යාපනය ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය තුළ, තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ කොළඹ නගර සභා සීමාව තුළ ඒ ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් දළබර හොන්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි නියමිත වැඩිම මිළට, මෙකී පළමුවන උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය. එලෙසම එකී ද්‍රව්‍යය එකී ප්‍රදේශය තුළ සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ කොළඹ නගර සභා සීමාව තුළ, ඒ ද්‍රව්‍යය සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලරට විකිණිය හැකි නියමිත වැඩිම මිළට මෙකී පළමුවන උපලේඛනයේ තුන්වන තීරයේ සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය.

(3) තවද, පළමුවන උපලේඛනයේ, පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍යය දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ප්‍රදේශයන්හි තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ, කොළඹ නගර සභා සීමාව තුළ, ඒ ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් දළබර හොන්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට මෙකී පළමුවන උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් මිළ ගණනුත් දෙවන උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් මිළ ගණනුත් එකතු කිරීමෙන් ලැබෙන මිළටය. එලෙසම, එකී ද්‍රව්‍ය එකී ප්‍රදේශයන් තුළ, සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක්, සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ, කොළඹ නගර සභා සීමාව තුළ, ඒ ද්‍රව්‍යය සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළට, මෙකී පළමුවන උපලේඛනයේ තුන්වන තීරයේ සඳහන් මිළ ගණනුත් එකතු කිරීමෙන් ලැබෙන මිළටය.

(4) මෙම නියෝගයෙහි කාර්‍ය්‍යය සඳහා—

(අ) මෙකී පළමුවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍ය වරකට හොන්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමෙක් බවටත් ;

(ආ) ඒ ද්‍රව්‍යය පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ හොන්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බවටත් නියම කරමි.

(5) තවද මෙකී නියෝගයෙහි සඳහන් ද්‍රව්‍ය මෙහි සඳහන් ප්‍රදේශයන්හි කිසිවකු විසින් වෙනත් දේ සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට නොවිකිණිය යුතුයි.

(6) මෙම නියෝගයෙහි සඳහන් සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක මෙහි සඳහන් ද්‍රව්‍ය සිය ස්වාමිත්වයේ හෝ පාලනයේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ද්‍රව්‍ය ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟල කට අඩු නොවන ඉලක්කම්වලින් පුවරුව එම භාජනය අසල ම සෑම ගණුදෙනු කාරයෙකුටම පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ එකී වාහනයේ තැබිය යුතුයි.

(7) මෙම නියෝගයෙහි කාර්‍ය සඳහා රාත්තල යනුවෙන් හැඳෙනුයේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව ගණන් ගන්නා රාත්තලයි.

(8) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරන ලද සෑම ප්‍රදේශයකම, මෙහි අග ඇති පළමුවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකිණීමේ දී, එය මිළ දී ගන්නාට ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර ඇතුළු කුවිතාන්සියක් දිය යුතුයි.

(අ) විකුණූ දිනය ;
(ආ) බර අනුව විකුණූ ප්‍රමාණය ;
(ඇ) ඒ සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය : එනම්, තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන වග.

(9) මෙම නියෝගයෙහි සඳහන් ද්‍රව්‍ය යම්කිසි දෙයක බහා දෙන්නේ නම් නැතහොත් ඔතා දෙන්නේ නම්, එහි මිළත් මෙම නියෝගයෙහි සඳහන් ගණන් වලට ඇතුලත් වන්නේය.

1965 ක්වූ දෙසැම්බර් මස 2 වැනි දින පස්වරු 3ට යාපනයේ දිසාපති කාර්යාලයේ දී අත්සන් තබන ලදී.

ෂ. පරම්නාදන්,
සාපනය දිසාවේ සහකාර (ආහාර) මිළ පාලක.

## පළමුවන උපලේඛනය

| | පළමුවන තීරය<br>ද්‍රව්‍යය | දෙවන තීරය<br>තොග වෙළෙන්දෙක් දළ බර හොන්ඩරයක් විකිණිය හැක්කේ කොළඹ නගර සභා සීමාව තුළ තොග වෙළෙන්දෙක් දළබර හොන්ඩරයක් විකිණිය හැකි නියමිත වැඩිම මිළට මෙහි සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය<br>රු. ශ. | තුන්වන තීරය<br>සිල්ලර වෙළෙන්දෙක් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැක්කේ කොළඹ නගර සභා සීමාව තුළ සිල්ලර වෙළෙන්දෙක් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි නියමිත වැඩිම මිළට මෙහි සඳහන් මිළ ගණන් එකතු කිරීමෙන් ලැබෙන මිළටය<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | ලූණු (රතුළූනු සහ වික්බෙලපූර් හැර වෙනත් සියළුම) | 2 92 | 0 03 |
| 2. | අර්තාපල් | 2 92 | 0 03 |
| 3. | කොත්තමල්ලි | 3 92 | 0 04 |
| 4. | වියලි නොකළ උලුඳු | 3 92 | 0 04 |
| 5. | මුං ඇට | 3 92 | 0 04 |
| 6. | තෝර පරිප්පු | 3 92 | 0 04 |
| 7. | කඩල පරිප්පු | 3 92 | 0 04 |
| 8. | සියඹලා | 3 92 | 0 04 |
| 9. | සුදුරු | 3 92 | 0 04 |
| 10. | කහ | 3 92 | 0 04 |
| 11. | සුදුලූනු (බොම්බෙ) | 3 92 | 0 04 |
| 12. | වියලි මිරිස් | 3 92 | 0 04 |

## දෙවන උපලේඛනය

| | පළමුවන තීරය<br>ප්‍රදේශ | දෙවන තීරය<br>තොග වෙළෙන්දෙක් දළ බර හොන්ඩරයක් විකිණිය හැක්කේ කොළඹ නගර සභා සීමාව තුළ තොග වෙළෙන්දෙක් දළ බර හොන්ඩරයක් විකිණිය හැකි නියමිත වැඩිම මිළට පළමුවන උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් මිළ ගණනුත් මෙහි සඳහන් මිළ ගණනුත් එකතු කිරීමෙන් ලැබෙන මිළටය<br>රු. ශ. | තුන්වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙක් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැක්කේ කොළඹ නගර සභා සීමාව තුළ සිල්ලර වෙළෙන්දෙක් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි නියමිත වැඩිම මිළට පළමුවන උපලේඛනයේ තුන්වන තීරයේ සඳහන් මිළ ගණනුත් මෙහි සඳහන් මිළ ගණනුත් එකතු කිරීමෙන් ලැබෙන මිළටය<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | වඩමාඩ්චි ප්‍රාදේශීය ආදයම් නිළධාරි තැනගේ කොට්ඨාශය තුළ | 0 45 | — |
| 2. | වලිකාමම් බටහිර ප්‍රා. ආ. නි. කො. තුළ | 0 35 | — |
| 3. | වලිකාමම් උතුර ප්‍රා. ආ. නි. කො. තුළ | 0 25 | — |
| 4. | වලිකාමම් නැගෙනහිර ප්‍රා. ආ. නි. කො. තුළ | 0 25 | — |
| 5. | ඩෙල්ෆ්ට් ප්‍රා. ආ. නි. කො. තුළ | 1 67 | 0 02 |
| 6. | දූපත් ප්‍රා. ආ. නි. කො. තුළ, නාගදීපය, එලුවදීපය, අනලදීපය යන ගම්සභා සීමාවන් හැර | 0 45 | — |
| 7. | දූපත් ප්‍රා. ආ. නි. කො. තුළ, නාගදීපය, එලුවදීපය, හා අනලදීපය යන ගම්සභා සීමාවන් තුළ | 0 91 | 0 01 |
| 8. | තෙන්මරාච්චි ප්‍රා. ආ. නි. කො. තුළ | 0 37 | — |
| 9. | පච්චිලාපලෙයි ප්‍රා. ආ. නි. කො. තුළ | 0 54 | 0 01 |
| 10. | කිලිනොච්චි ප්‍රා. ආ. නි. කො. තුළ | 0 67 | 0 01 |
| 11. | කුනුක්කායි | 1 09 | 0 01 |
| 12. | පූනකරි ප්‍රා. ආ.නි. කො. තුළ | 0 74 | 0 01 |

**සැළකිය යුතුයි.**—මෙහි සඳහන් මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ දී නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන් වේ. මේ මිළ ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකි ය.

12–587

# ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 1965 නොවැම්බර් 30 වැනි දිනට ශේෂ පත්‍රය

(මුදල් නීති පනතේ 34 වැනි (පරිච්ඡේදය 422) වගන්තියට අනුව)

| වගකීම් | රුපියල් | රුපියල් |
|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම් :** | | |
| ප්‍රාග්ධනය ... ... | 1,50,00,000 | |
| අතිරික්තය ... ... | 5,30,00,000 | |
| | | 6,80,00,000 |
| **වගකීම් :** | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු ... | 93,29,33,999 | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 5,76,25,475 | |
| | | 99,05,59,474 |
| නිකුත් කළ හා බේරීමට ඇති ණයපත් | | 5,33,94,000 |
| **තැන්පතු :** | | |
| රජය ... ... | 13,42,696 | |
| රාජ්‍ය නියෝජ්‍යත්වය හා සංස්ථා ... | 33,57,686 | |
| වෙළඳ බැංකු ... ... | 14,69,46,552 | |
| ජාත්‍යන්තර සංවිධාන— | | |
| විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන ... ... | 26,46,87,141 | |
| අනෙකුත් ... ... | 39,23,687 | |
| | | 42,02,57,762 |
| අනෙකුත් වගකීම් හා ගිණුම් ... | | 18,82,54,107 |
| | | 1,72,04,65,343 |

| වත්කම් | රුපියල් | රුපියල් |
|---|---|---|
| **ජාත්‍යන්තර සංචිතය :** | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) | 18,64,87,584 | |
| * විදේශීය රාජ්‍ය ණයපත් ... | 10,18,26,843 | |
| | | 28,83,14,427 |
| **දේශීය වත්කම් :** | | |
| ණය සහ අත්තිකාරම්— | | |
| † රජයට ... ... | 22,46,41,283 | |
| අනෙකුත් අයට ... ... | 34,50,000 | |
| රජයේ හා රජය සහතික කළ ණයපත්... | 1,10,60,74,743 | |
| | | 1,33,41,66,026 |
| අනෙකුත් වත්කම් හා ගිණුම් ... | | 9,79,84,890 |
| | | 1,72,04,65,343 |

*(අ) 1964 පෙබරවාරි 1 වැනි දින රු. 4,59,05,735ක ප්‍රකාශිත වටිනාකමට හා (ආ) 1965 මැයි 24 වැනි දින රු 2,97,24,894ක වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් ණයපත් ඇතුළත් වේ. ඒ දිනවල මෙකී ණයපත් වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රුපියල් 3,66,42,791 සහ රුපියල් 2,55,56,234ක් විය.

† 1961 අංක 7 දරණ ජාත්‍යන්තර සංවර්ධන සංගම් ගිවිසුම් පනතේ සහ සංශෝධිත බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පනතේ (424 පරිච්ඡේදය) නියමයන් ප්‍රකාර, ජා. මු. ම., ජා. ප්‍ර. ස. බැ. හා ජා. ස. ස. ට ලංකාවේ දයක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රුපියල් 6,12,41,283ක විශේෂ ණය ද ඇතුලත් වෙයි.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,
අධිපති.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂ පත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදි. මහ බැංකුවේ පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව, 1965 නොවැම්බර් මස 30 වැනි දිනට බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි, ශේෂ පත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි.

බී. ඇල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
ඔඩිටර් ජනරාල්.

1965 දෙසැම්බර් මස 7 වැනි දින, කොළඹ දී ය.
12–586

[illegible]
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි